**මහව ප්‍රාදේශීය සභාව - 2021**

**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මහව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මහව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල සභාව සතු පුස්තකාලය හා පොදු වෙළඳපල සංවර්ධනය සඳහා දරා තිබූ රු.5,000,338 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කළ යුතු ප්‍රාග්ධනිත කිරීම් ඉදිරි ගිණුම් වලින් ගිණුම්ගත කරන බව සඳහන් කරමි. | ගොඩනැගිලි සංවර්ධන වියදම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක උසාවි දඩ ශේෂය රු.3,864,625 ක් වුවත් එය රු.2,987,000 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.877,625 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කර ගන්නා බව සඳහන් කරමි. | උසාවි දඩ නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ඇ) | වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය රු.13,592,137ක් විය යුතු වුවත් රු.19,548,206 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.5,956,069ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි | 2022 වර්ෂයේ ගිණුම්වලදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුද්දර ගාස්තු නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,281,032 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,037,800 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **වරිපනම් හා බදු** | | |
| | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් ඒකක 1,651 කින් රු.4,993,440 ක වරිපනම් බදු මුදලක් අයකර නොතිබුණු අතර, අයකර ගැනීමට වැඩ පිළිවෙලක්ද සකස් කර නොතිබුණි. | අයකර ගැනිමට වහාම කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග යොදාගෙන හිඟ ආදායම් අයකර ගත යුතු වේ. |
| | **කුලී** | | |
| (අ) | මහව පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 24 කින් 2021 දෙසැම්බර් 31 දිනට රු.410,384ක මුදලක් අයකර නොතිබුණි. | රු. 422,867 ක මුදලක් covid-19 වසංගත රෝගී තත්ත්වය හේතුවෙන් කපා හැරීම සඳහා මහසභා අනුමැතියෙන් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමුකර ඇත. තවදුරටත් පවතින හිග මුදල් ඉදිරි කාලයේදී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | කඩ කුලී කාලීනව අයකරගත යුතුවේ. |
| (ආ) | මහව ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂික ටෙන්ඩර් මත සතිපොළ 02 ක්, මාළු කඩ 03 ක් හා මස් කඩ 02 ක් බදු දීම් වලට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට අවස්ථා 07 කදී අයවිය යුතු රු.2,085,415 ක බදු කුලී ශේෂයක් අයකර නොතිබුණි. | තවදුරටත් පවතින හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අඹන්පොළ බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 07 කින් රු.526,039 ක හිඟ කුලී මුදලක් හා රු.63,592 ක දඩ මුදලක් අය විය යුතුව පැවතුණි. | රු.109,889 මුදලක් කපා හැරීමට ආණ්ඩුකාර අනුමැතියට යවා ඇත. | හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| | **වෙනත් ආදායම්** | | |
| | 2021 වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහව ප්‍රාදේශීය සභාව සතුව පවතින මාර්ග තලනය, ඩ්‍රම් රථය හා JCB යන්ත්‍ර 03 කුලියට දීම වෙනුවෙන් අවස්ථා 05 කදී ලැබිය යුතු ආදායම් පිළිබඳව පරීක්ෂාවේදී මාර්ග සංවර්ධන අධිකාරියෙන් හා පුද්ගලයින් | මාර්ග සංවර්ධන අධිකාරියෙන් රු.172,540 ක මුදලක් ලැබී ඇත. පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලැබිය යුතු මුදලින් එක් | මෙම මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| දෙදෙනෙකුගෙන් රු.2,172,293ක මුදලක් අයකර නොතිබුණි. | පුද්ගලයෙකුගෙන් රු.7,755 ක් අයවී ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මදුරුගම නැමැති ගමෙහි බිම් කට්ටි අංක 107 දරන ඉඩම අක්කර 03 පර්චස් 20 ක ඉඩම් ප්‍රමාණයක් 1968 පෙබරවාරි 16 දින කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් එවකට ගම් සභාව වෙත නිවාස යෝජනා ක්‍රමයක් සඳහා පවරා දී තිබුණි. මෙම ඉඩම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන හා නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර මෙම ඉඩම පිළිබඳව 2022 අප්‍රේල් 08 දින භෞතික පරීක්ෂාවේ දී පවුල් 21 ක් 1990 වර්ෂයේ සිට අනවසරයෙන් මෙම ඉඩමේ ස්ථිර නිවාස සාදා වසර ගණනාවක සිට පදිංචි වී ඇතත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මාදුරුගම නිවාස යෝජනා ව්‍යාපෘතියක් සඳහා මෙම ඉඩම 1968 පෙබරවාරි 16 වන දින එවක ගම් සභාව වෙත පවරා දී ඇත. එම පැවරුම් නියෝගයේ දක්වා ඇත්තේ මෙම ඉඩම නිවාස යෝජනා ව්‍යාපෘතියක් සඳහා පමණක් යොදාගත යුතුය ලෙසය. නමුත් ප්‍රදේශයේ ඉඩම් නොමැති පවුල් මෙම භූමියේ ස්ථිර නිවාස සාදා පදිංචි වී ඇත. | ඉඩම බදු දී ආදායම් ලබා ගැනීමට හෝ නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වේ. |